06 NOV 2017

මගේ අංකය :- 16/03/02
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය
මහකනදරාව ව්‍යාපාරය
රඹෑව
2017/10/23
ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ සියළුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

**ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම/ 2017/18 මහ පෙර කන්න රැස්වීම් වාර්තාව**
**ඔක්තෝබර් මාසය - මහකනදරාව ව්‍යාපාරය**

දිනය - 2017/10/12
වේලාව - පෙ.ව.9.30
ස්ථානය - මහකනදරාව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලීය රැස්වීම් ශාලාව

**සහභාගී වූ රජයේ නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 01 | අයි.ඩී.එන්.අයි.පතිරණ මිය | නේවාසික ව්‍යාපාර කළමනාකරු | මහකනදරාව ව්‍යාපාරය |
| 02 | පී.යු.කේ. තිලකරත්න මයා | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු | වාරි. ඉංජිනේරු කාර්යාලය - අනුරාධපුර |
| 03 | පී.පී. අමල් බංඩාර මයා | වාරිමාර්ග ඉංජිනේරු | වාරි. ඉංජිනේරු කාර්යාලය - අනුරාධපුර |
| 04 | බී.ටී. මහආරච්චි මයා | ඉංජිනේරු සහකාර | වාරි.ඉංජිනේරු කාර්යාලය, අනුරාධපුර |
| 05 | එල්.බී.පී.ඩී.එස්. කුලරත්න මිය | ඉංජිනේරු සහකාර | වාරි.ඉංජිනේරු කාර්යාලය, අනුරාධපුර |
| 06 | යූ.ජී.ඒ.එස්. ආරියරත්න මයා | සංවර්ධන නිලධාරි | මහකනදරාව ව්‍යාපාරය |
| 07 | ජී.කේ.එම්.යූ.එස්.සී. කවිරාජ් මයා | ජනපද නිලධාරි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - රඹෑව |
| 08 | සී.එම්. රන්මැණිකේ මිය | ජනපද නිලධාරි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මිහින්තලය |
| 09 | ඒ.ජී.එස්. සුභාෂිණී මිය | මූලස්ථාන කෘෂිකර්ම උපදේශක | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - රඹෑව |
| 10 | ඒ.ඩී. නාමල්වැව මෙනවිය | කෘෂිකර්ම උපදේශක | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - රඹෑව |
| 11 | ආර්.පී. ප්‍රනාන්දු මයා | කෘෂිකර්ම උපදේශක | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - රඹෑව |
| 12 | එස්.පී. සුනිල් මයා | ක්ෂේත්‍ර නිලධාරි | කෘෂි රක්ෂණ මණ්ඩලය - අනුරාධපුර |
| 13 | එච්.ඒ්.ඒ. ශ්‍රීමාලි මිය | ස.ප්‍රා. කළමනාකරු | වී අලෙවි මණ්ඩලය - අනුරාධපුර |
| 14 | ටී.එම්.එන්.එම්.ඩී. තෙන්නකෝන් මිය | ස.ප්‍රා. කළමනාකරු | වී අලෙවි මණ්ඩලය - අනුරාධපුර |
| 15 | සුදත් ගමගේ මයා | සත්ව සංවර්ධන උපදේශක | පශු වෛද්‍ය කාර්යාලය - රඹෑව |
| 16 | නිරන්ජන් සිල්වා මයා | සත්ව සංවර්ධන උපදේශක | පශු වෛද්‍ය කාර්යාලය - මිහින්තලය |
| 17 | එස්.ජී.එම්.එම්.ඩී. සෙනෙවිරත්න මිය | තාක්ෂණ සහකාර | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - රඹෑව |
| 18 | ඩී.එම්. තිලක් දිසානායක මයා | කෘ.ප.නි.ස | ගොවිජන සේවා මධ්‍යස්ථානය - කල්ලංචිය |
| 19 | ඩී.එම්. ධර්මලතා මිය | කෘ.ප.නි.ස | ගොවිජන සේවා මධ්‍යස්ථානය - කල්ලංචිය |

**සහභාගි වූ ගොවි නියෝජිතයින්**

| අනු අංකය | නම | තනතුර | ගොවි සංවිධානය |
|---|---|---|---|
| 01 | ආර්.එම්.ආර්. රාජපක්ෂ මයා | ගරු සභාපති | ඒකාබද්ධ ගොවි සංවිධානය |
| 02 | මල්ලිකා සෙනවිරත්න මිය | ගරු භාණ්ඩාගාරික | ව.ඉ. එකමුතු ගොවි සංවිධානය |
| 03 | සුභසිංහ රත්නායක මයා | ගරු සභාපති | ව.ඉ. රණමයුර ගොවි සංවිධානය |
| 04 | එම්. ජයපාල මයා | ගරු භාණ්ඩාගාරික | ද.ඉ. රණමයුර ගොවි සංවිධානය |
| 05 | එස්. එම්. ඩිංගිරිබංඩා මයා | ගරු භාණ්ඩාගාරික | ව.ඉ. රණමයුර ගොවි සංවිධානය |
| 06 | ඩබ්.ඩී.එල්. ගුණසේකර මයා | ගරු භාණ්ඩාගාරික | ව.ඉ. මහසෙන් ගොවි සංවිධානය |
| 07 | එම්. කුමාරසිංහ මයා | ගරු සභාපති | ද.ඉ. රණමයුර ගොවි සංවිධානය |
| 08 | ඩබ්. තිලකරත්න බංඩාර මයා | ගරු සභාපති | ව.ඉ. මිහිඳු ගොවි සංවිධානය |
| 09 | එස්.ඩී. සුනිල් මයා | ගරු ලේකම් | ද.ඉ. පැරකුම් යාය 05 ගොවි සංවිධානය |
| 10 | බී. ප්‍රේමදාස මයා | ගරු භාණ්ඩාගාරික | ද.ඉ. පැරකුම් යාය 05 ගොවි සංවිධානය |
| 11 | එච්. කීර්තිපාල මයා | ගරු ලේකම් | ව.ඉ. රඹෑවගම ගොවි සංවිධානය |

| | | | |
|---|---|---|---|
| 12 | ආර්.පී. සරණපාල මයා | ගරු ලේකම් | ව.ඉ. මිහිඳු ගොවි සංවිධානය |
| 13 | එස්.එච්. අබුල් කිරාම් මයා | ගරු භාණ්ඩාගාරික | ද.ඉ. ෂම් ෂම් ගොවි සංවිධානය |
| 14 | එම්. ප්‍රේමරත්න මයා | ගරු සභාපති | ද.ඉ. පැරකුම් යාය 05 ගොවි සංවිධානය |
| 15 | එස්.එම්.කේ.බී. සමරකෝන් මයා | ගරු භාණ්ඩාගාරික | ව.ඉ. මිහිදු ගොවි සංවිධානය |
| 16 | එස්. එම්. වීමල් සමරනායක මයා | ගරු සභාපති | ව.ඉ. මහසෙන් ගොවි සංවිධානය |
| 17 | කේ. එම්. ලිලිත් සමන් කුමාර මයා | ගරු ලේකම් | ව.ඉ. මහසෙන් ගොවි සංවිධානය |
| 18 | කේ.එම්. ආර්. චන්දන බංඩාර මයා | ගරු ලේකම් | ද.ඉ. මහසෙන් ගොවි සංවිධානය |
| 19 | එච්. එම්. රත්නායක මයා | ගරු සභාපති | ව.ඉ. සුහද ගොවි සංවිධානය |
| 20 | ඩබ්.එන්.පී. විමල් රත්නසිරි මයා | ගරු භාණ්ඩාගාරික | ද.ඉ. සමගි ගොවි සංවිධානය |
| 21 | ජී. ධර්මපාල මයා | ගරු ලේකම් | ව.ඉ. එක්සිත් ගොවි සංවිධානය |
| 22 | එම්. ආනන්ද ජගත්වංශ මයා | ගරු සභාපති | ද.ඉ. පැරකුම් යාය 02 ගොවි සංවිධානය |
| 23 | එච්. චන්ද්‍රා කුමාරි මිය | ගරු ලේකම් | ව.ඉ. එකමුතු ගොවි සංවිධානය |
| 24 | යූ.බී. සෙනවිරත්න මයා | ගරු සභාපති | ද.ඉ. වේළුසුමන ගොවි සංවිධානය |
| 25 | එම්.සී.එම්. නවාහිර් මයා | ගරු සභාපති | ද.ඉ. ෂම් ෂම් ගොවි සංවිධානය |
| 26 | එස්. ආරියරත්න මයා | ගරු ලේකම් | ද.ඉ. වේළුසුමන ගොවි සංවිධානය |
| 27 | එස්. ටී.බී. සුහසිංහ මයා | ගරු සභාපති | ව.ඉ. රඹෑවගම ගොවි සංවිධානය |
| 28 | අයි. එම්. ජයතිස්ස මයා | ගරු සභාපති | ද.ඉ. සුහද ගොවි සංවිධානය |
| 29 | යූ.ජී. චමින්ද හේමන් කුමාර මයා | ගරු ලේකම් | ද.ඉ. සුහද ගොවි සංවිධානය |
| 30 | යසපාල සෙනවිරත්න මයා | ගරු ලේකම් | ද.ඉ. සමගි ගොවි සංවිධානය |

ආගම සිහි කිරීමෙන් අනතුරුව නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමිය විසින් පැමිණ සිටි සියලු දෙනා පිළිගත් අතර රැස්වීමේ න්‍යාය පත්‍රය සභාගත කරන ලදි.

**01. පසුගිය රැස්වීම් වාර්තාව සමාලෝචනය හා එකඟතාවය ලබා ගැනීම.**

පසුගිය රැස්වීම් වාර්තාවේ සහභාගි වූ රජයේ නිලධාරින්ගේ නම් ලැයිස්තුවෙහි ආර්.පී. ප්‍රනාන්දු මහතා නියෝජනය කළ ආයතනය කෘෂිකර්ම උපදේශක කාර්යාලය රඹෑව ලෙස නිවැරදි විය යුතු බව මුලස්ථාන කෘෂිකර්ම උපදේශක සුභාෂණී මහත්මිය පෙන්වා දුන් අතර සහභාගි වූ ගොවි නියෝජිතයින් ලැයිස්තුවේ ආර්.එම්.ආර්. රාජපක්ෂ මහතාගේ තනතුර ගරු සභාපති ඒකාබද්ධ ගොවි සංවිධානය ලෙසට නිවැරදි විය යුතු බව ආර්.එම්.ආර්. රාජපක්ෂ මහතා පෙන්වා දුන් අතර එම සංශෝධනයන්ට යටත්ව පසුගිය රැස්වීම් වාර්තාව දකුණු ඉවුර රණමයුර ගොවි සංවිධානයේ ගරු සභාපති එම්. කුමාරසිංහ මහතාගේ හා දකුණු ඉවුර පැරකුම් යාය 05 ගොවි සංවිධානයේ ගරු සභාපති එම්. ප්‍රේමරත්න මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

02. ලිපි ඉදිරිපත් කිරීම.

| අනු අංකය | නිකුත් කල අය/ ආයතනය | කාරණය | වෙනත් |
|---|---|---|---|
| 2.1 | අධ්‍යක්ෂ වාරිමාර්ග කළමනාකරණ අංශය | ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමය 2017.10.06 සිට 12 දින දක්වා | ලිපිය සභාවට ඉදිරිපත් කළ අතර ගොවි සංවිධාන මට්ටමින් කළ හැකි ක්‍රියාකාරකම් පිළිබඳව සාකච්ඡා කරන ලදී. |
| 2.2 | ප්‍රාදේශීය ලේකම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මිහින්තලය | කනදරා ඔයේ (වැලි ඔයේ) ජල බාධක ලෙස පවතින ගස් පිළිබඳ හඳුනාගත් ලේඛනය දිස්ත්‍රික් ලේකම්තුමා වෙත හා දිස්ත්‍රික් වන හා පරිසර කමිටුවට දැනුම් දීම | ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී. |
| 2.3 | ගරු සභාපති ද.ඉ. ෂම් ෂම් ගොවි සංවිධානය | ද.ඉ. OT 14 හා OT 16 ඇල මාර්ග වල නඩත්තු කටයුතු සඳහා J.C.B. යන්ත්‍රයක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම. | වාරිමාර්ග දෙපාර්තමේන්තුවට යොමු කරන ලදී. |

**03.** ආයතන සංවර්ධන කටයුතු - සංවර්ධන නිලධාරි යූ.ජී.ඒ.එස් ආරියරත්න මහතා

**3.1 2017 සැප්තැම්බර් මස ප්‍රගතිය**

| අනු අංකය | කාරණය | ප්‍රගතිය | වෙනත් |
|---|---|---|---|
| 3.1.1 | කාරක සභා රැස්වීම් පැවැත්වීම | 12 | ද.ඉ. වේළුසුමන/ ද.ඉ. සුහද/ ව.ඉ.මිහිඳු හැර අනෙකුත් ගොවි සංවිධාන රැස්වීම් පවත්වා ඇත. |
| 3.1.2 | 2017 ඔක්තෝබර් මස මාසික මුදල් සාරාංශ කාර්යාලයට ලබා ගැනීම (2017.10.12 දිනට) | 04 | ව.ඉ. එකමුතු/ව.ඉ. රණමයුර/ ව.ඉ. මිහිඳු/ද.ඉ. සමගි ගොවි සංවිධාන |

3.2 පුහුණු වැඩසටහන් පැවැත්වීම.

3.2.1 ක්ෂේත්‍ර අත්දැකීම් හුවමාරු වැඩසටහන 2017/09/21, 22, 23 දිනයන්හි සිදු කල අතර බඳුළු ඔය, බත් මැඩිල්ල/ කිරිදිඹිය හා රිදියගම ව්‍යාපාරයන්හි ක්‍රියාත්මක වන කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් සහ රිදියගම රජයේ සත්ව ගොවිපලආශ්‍රිතව සත්ව පාලන වැඩසටහන් පිලිබඳව අත්දැකීම් ලබා ගත් අතර එම ලබා ගත් අත්දැකීම් මහකනදරාව ව්‍යාපාරයේ දියුණුව සඳහා ද යොදා ගැනීමට කටයුතු කරන ලෙසත්

3.3 සිරි දළදා යල් අස්වනු පූජාව
මෙම වැඩසටහන සඳහා 2017/10/01 දින ගොවි මහත්ම මහත්මීන් 72 ක් සහභාගි වූ අතර ගොවි සංවිධාන මට්ටමින් ලබා දී තිබූ මූල්‍ය ආධාර හා පූජා ද්‍රව්‍ය පිළිබඳ ලේඛනය සභාවට ඉදිරිපත් කරන ලදී.

3.4 අඹ වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන
ගොවි සංවිධාන මට්ටමින් ඉදිරිපත් වූ ඉල්ලීම් ප්‍රධාන කාර්යාලයට යොමු කළ අතර ගොවීන් 50 දෙනෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් විසින් ඉල්ලීම කර තිබෙන ව.ඉ. සුහද ගොවි සංවිධානය මුල් වටය සඳහා තෝරා ගෙන ඇති බවත් ඉදිරියේදී එම වැඩසටහන පිළිබඳව වැඩිදුරටත් දැනුවත් කරන බව නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමිය පැහැදිලි කළ අතර

3.5 විශේෂ වැඩසටහන්

පරිසර මාසය යෙදී ඇති ඔක්තෝබර් මාසය තුල මහකනදරාව වාරිමාර්ග රක්ෂිතය තුළ සිටුවීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා මී සහ කුඹුක් පැළ ලබා ගැනීමට සැලසුම් කර ඇති බව ද දැනුම් දුන් අතර පහත සඳහන් පරිදි පැළ ලබා දෙන ලෙසට ගොවි සංවිධාන විසින් ඉල්ලීම් කරන ලදී.

| අනු අංකය | ගොවි සංවිධානය | කුඹුක් පැල | මී පැල |
|---|---|---|---|
| 1 | ව.ඉ. මිහිඳු ගොවි සංවිධානය | 10 | 10 |
| 2 | ව.ඉ. සුහද ගොවි සංවිධානය | - | 10 |
| 3 | ව.ඉ. රණමයුර ගොවි සංවිධානය | - | 10 |
| 4 | ද.ඉ. පැරකුම් යාය 02 ගොවි සංවිධානය | 50 | - |
| 5 | ද.ඉ. සමගි ගොවි සංවිධානය | - | 50 |
| 6 | ද.ඉ. සුහද ගොවි සංවිධානය | - | 50 |

**04.** වාරිමාර්ග මෙහෙයුම් හා නඩත්තු කටයුතු :- ඉංජිනේරු සහකාර බී.ටී.මහආරච්චි මහතා

4.1 අද දිනට ජලාශයේ ජල මට්ටම :- අඩි 6 අඟල් 2 1/2 ක් බවත් (ජල ධාරිතාවය අක්කර අඩි 7050)

4.2 මෙහෙයුම් හා නඩත්තු කටයුතු යටතේ වම් ඉවුර හා දකුණු ඉවුර ප්‍රධාන ඇලවල් වල නඩත්තු වැඩ කටයුතු ආරම්භ කර ඇති බවත්

4.3 දකුණු ඉවුර පැරකුම් යාය 05, දකුණු ඉවුර පැරකුම් යාය 02, දකුණු ඉවුර මහසෙන්, ද.ඉ. සමගි යන ගොවි සංවිධාන විසින් කළ ඉල්ලීම් අනුව නඩත්තු කටයුතු කර ගැනීමට අවශ්‍ය යන්ත්‍ර ලබා දුන් බවත්

4.4 දකුණු ඇලෙහි ගැටලුකාරී ලෙස පිරී තිබූ රොන් මඩ ඉවත් කළ බවත්

4.5 ගොවි සංවිධාන විසින් සකස් කරන ලද නඩත්තු ගිවිසුම් දකුණු ඉවුර වේළුසුමන හා දකුණු ඉවුර ෂම් ෂම් ගොවි සංවිධාන අත්සන් කර නොමැති බවත් එම කටයුතු හැකි ඉක්මනින් අවසන් කරන ලෙසත් දැනුම් දෙන ලදී.

4.6 2017/18 මහ පෙර වගා තීරණ ගැනීම සඳහා මහ පෙන්වීම.

මේ වන විට ජලාශයේ ජලධාරිතාවය අවම මට්ටමක පවතින බවත් (අක්කර අඩි 7050) පසුගිය කන්න කීපයක වගාව ආරම්භ කරන විට පැවති දත්තයන් පහත පරිදි බවත්

| කන්නය | දිනය | ජල ධාරිතාවය (අක්කර අඩි) |
|---|---|---|
| 2011 - 2012 මහ | 2011.11.04 | 28400 |
| 2012 - 2013 මහ | 2012.11.02 | 16000 |
| 2014 - 2015 මහ | 2014.11.11 | 13500 |

| | | |
|---|---|---|
| ජලාශයේ ජලධාරිතාවය | අක්කර අඩි | 36250 |
| අච් ධාරිතාවය | අක්කර අඩි | 2000 |
| සඵල ධාරිතාවය | අක්කර අඩි | 34250 බවත් |

කන්නය ආරම්භ කිරීම සඳහා අවම වශයෙන් අක්කර අඩි 15400 ක ජල ධාරිතාවයක් තිබිය යුතු බවත් කන්නය සඳහා අවශ්‍ය මුළු ධාරිතාවය අක්කර අඩි 28640 ක් බවත් පැහැදිලි කළ අතර වගාව සඳහා ජලය නිකුත් කිරීමට නම් අවම වශයෙන් ජලාශයේ ජල මට්ටම අඩි 12 වත් තිබිය යුතු බවත් ඒ අනුව ඉදිරියේ දී සැලකිය යුතු වර්ෂාපතනයක් ලැබුණහොත් පමණක් කන්නයේ වගා කටයුතු ආරම්භ කළ හැකි බවත් ඉදිරි වැසි අපේක්ෂාවෙන් 2017/11/01 දින ජලය නිකුත් කිරීමට සුදුසු දිනය ලෙස නිර්දේශකළ හැකි බව වාරිමාර්ග ඉංජිනේරු පී.යු.කේ තිලකරත්න මහතා පැහැදිලි කරන ලදී.

4.7 ගොවි සංවිධාන මට්ටමින් ඉදිරිපත් කළ වාරි පද්ධතියේ ගැටලු

| අනු අංකය | ඉදිරිපත් කළ අය | කාරණය | වෙනත්/තීරණ |
|---|---|---|---|
| 4.7.1 | ගරු සභපති ඒකාබද්ධ ගොවි සංවිධානය | ප්‍රධාන ඇල මාර්ගයන්හි කැළය ශුද්ධ කිරීම ගොවි සංවිධාන මට්ටමින් කොන්ත්‍රාත් පදනමට ලබා දී හෝ එම කටයුතු ඉක්මන් කරන ලෙසත් වම හා දකුණු ඉවුර ඇලවල් දෙකෙහිම අගාවත් දක්වා රොන් මඩ පිරී ඇති ස්ථාන වලින් රොන් මඩ ඉවත් කර ගැනීම පිළිබඳව ව.ඉ. සුහද ගොවි සංවිධාන බල ප්‍රදේශයේ නල බට පද්ධතිය එලීමේදී රක්ෂිත සීමාව තුල බට එලා තිබීම තවමත් නිවැරදි කර නැති අතර කුඹුරු බට කීපයකටද හානි වී ඇති බව | අදාල ආයතනය ඒ පිලිබඳව දැනුවත් කර ඇති බව ඉංජිනේරු සහකාර මහතා පවසන ලදී. |
| 4.7.2 | ගරු සභපති ද.ඉ. පැරකුම් යාය 05 ගොවි සංවිධානය | කෘෂි මාර්ග නඩත්තුව සඳහා බොරළු ලබා ගැනිමට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලීම | බොරළු ලබා ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය ඉංජිනේරු සහකාර මහතා පැහැදිලි කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| 4.7.3 | ගරු සභාපති ද.ඉ. පැරකුම් යාය 02 ගොවි සංවිධානය | OT 7 ඇල පාලම නඩත්තු කටයුතු කර ගැනීම සඳහා ඇස්තමේන්තුවක් සකසා දෙන ලෙස ඉල්ලීම. | ලිඛිතව ඉල්ලීමක් කරන ලෙසට දැනුවත් කරන ලදී. |
| 7.7.4 | ගරු භාණ්ඩාගාරික ද.ඉ. සමගි ගොවි සංවිධානය | දකුණු ඉවුර ඇල අගාවත දක්වාම රොන්මඩ පිරී ඇති ස්ථාන ඉක්මනින් ශුද්ධ කර දෙන ලෙසත් ගොඩ ඉඩම් වලින් ජලය ගලා එන ස්ථාන වලින් ප්‍රධාන ඇලට එකතු වන රොන්මඩ ඉවත් කර දෙන ලෙසත් ඉල්ලීම. | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කරන ලදී. |
| 7.7.4 | ගරු ලේකම් ව.ඉ. මිහිඳු ගොවි සංවිධානය | මාගා ආයතනය ව.ඉ. මාර්ගය සකස් කිරීමේදී OT 8 - OT 9 අතර වාරිමාර්ග රක්ෂිත ගල් කණුවක් ගලවා දමා ඇති බවත් බොක්කුව අළුත් වැඩියාව මෙතෙක් නිමකර නැති බැවින් මහ කන්නයේ වගාවට ජලය නිකුත් කිරීමට පෙර එම බෝක්කුවේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කරවීමට අවධානය යොමු කළ යුතු බව | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කරන ලදී. |
| 4.7.5 | ගරු සභාපති ව.ඉ. සුහද ගොවි සංවිධානය | නල බට පද්ධතිය එළිකිරීමේදී රක්ෂිත සීමා කණු හා මායිම් ගල් ගලවා ඇති බවත් ඒ පිළිබඳ අවධානය යොමු කරන ලෙස | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කරන ලදී. |
| 4.7.6 | ගරු ලේකම් ව.ඉ. මහසෙන් ගොවි සංවිධානය | G 5 ඇලෙහි බට පද්ධතිය සකසා ගැනීමට සහයෝගය ලබා දෙන ලෙසත් අබලන් වී ඇති ජල පාලන ගේට්ටු සකසා දෙන ලෙසත් ඉල්ලීම | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අවධානයට යොමු කරන ලදී. |
| 4.7.5 | ගරු සභාපති ද.ඉ. පැරකුම් යාය 05 ගොවි සංවිධානය | A 9 මාර්ගයේ සිදු කරන ප්‍රතිසංස්කරණ කටයුතු යටතේ දකුණු ඉවුර ඇලෙහි බෝක්කුව නවීකරණය සිදු කරන අතර කන්නය ආරම්භ කිරීමට ප්‍රථම එම වැඩ කටයුතු අවසන් කරවීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මැදිහත් වීම අවශ්‍ය බව. | ඒ පිළිබඳ එම ආයතනය දැනුවත් කර ඇති බව ඉංජිනේරු සහකාර මහතා පැහැදිලි කරන ලදී. |
| 4.7.6 | ගරු භාණ්ඩාගාරික ව.ඉ. රණමයුර ගොවි සංවිධානය | OT 5 G 5 බෙදුම හා දොරවල් 2, OT 5 ජලය උතුරන ස්ථානයේ බැම්ම සකස් කර දෙන ලෙස, OT 5 G 7 ඇලෙහි පාලම සාදා දෙන ලෙස ඉල්ලීම. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු සකස් කර ඇතත් ප්‍රතිපාදන නොමැතිකම ගැටළුවක්ව පවතින බව ඉංජිනේරු සහකාර මහතා පැහැදිලි කරන ලදී. |
| 4.7.7 | ගරු සභාපති ඒකාබද්ධ ගොවි සංවිධානය | වාරිමාර්ග පද්ධතියේ දිගු කාලයක් තිස්සේ නොවිසඳී පවතින ගැටලු විසඳා ගැනීම සඳහා මහකනදරාව ව්‍යාපාරයට වෙනම වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයක් ලබා දෙන ලෙස ඉල්ලීම. | |
| 4.7.8 | ගරු සභාපති ද.ඉ. සුහද ගොවි සංවිධානය | G 8 ඇලේ අගාවත ගස් ඉවත් කර ගැනීම, G 15 ඇලෙහි පැති බැම්ම සකසා ගැනීම සඳහා J.C.B යන්ත්‍රයක් ලබා දෙන ලෙස ඉල්ලීම | |

**05.** කෘෂි කාර්මික සංවර්ධන කටයුතු :- මූලස්ථාන කෘෂිකර්ම උපදේශක සුභාෂිණී මහත්මිය.

5.1 මිරිස් වගාව ව්‍යාප්ත නොවූ නව ප්‍රදේශ සඳහා මිරිස් බීජ 2Kg ලබා දී එම බීජ මේ වන විට තවාන් මට්ටමේ පවතින බවත්

5.2 2017/18 මහ කන්නය සඳහා බඩ ඉරිඟු බීජ 50% දායකත්වය යටතේ ලබා දීමට නියමිත අතර මේ සඳහා දේශීය, දෙමුහුම් හා විදේශීය දෙමුහුම් බඩ ඉරිඟු, බීජ ලබා දීමට අපේක්ෂිත බවත්

5.3 මේ දිනවල මිරිස් තවාන් පාලනය, බඩ ඉරිඟු වගාව, ගෙවතු සැලසුම් කිරීම, කාබනික පොහොර වැඩසටහන් ආදී අවශ්‍යතාවන් පරිදි පුහුණු වැඩසටහන් පවත්වන බවත්

5.4 මී මැසි පාලන ගම්මාන වැඩසටහන යටතේ ව.ඉ. යාය 02 ප්‍රදේශයේ මී මැසි පෙට්ටි 20 ක් ලබා දී ඇති බවත්

5.5 ගොවි කාන්තා කණ්ඩායම් සඳහා 2017/10/20 දින ගන්නෝරුව කෘෂි තාක්ෂණ උද්‍යානයට ක්ෂේත්‍ර චාරිකාවක් සඳහා සැලසුම් කර ඇති බවත් දැනුම් දුන් අතර

5.6 2017/18 මහ පෙර කන්නය සඳහා මඟ පෙන්වීම

5.6.1 මේ වන විට මහකනදරාව ජලාශයේ පවතින ජල මට්ටම අනුව නිශ්චිතම වගා තීරණයකට යෑම අපහසු අතර වර්ෂාව සමඟ ජලය ලැබී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේද නිර්දේශය අනුව වගාවට යොමු වීම සුදුසු බවත් ජලය නිකුත් කළ හැකි කාල සීමාව අනුව වගා කරන වී ප්‍රභේදයන් තීරණය කිරීම සුදුසු බවත්

5.6.2 කුඹුරට ජලය ලබා ගන්නා ඇල වේලි නිසි පරිදි ශුද්ධ කරන ලෙසත් කුඹුර තුළ නියරවල, ලියදි වල පවතින වල් පැල ශුද්ධ කර වක්කඩවල් බැඳ ජලය ආරක්ෂා කර ගැනීමේ ක්‍රම වේදයන් යොදා ගන්නා ලෙසත්

5.6.3 පසේ පෝෂණ තත්ත්වය දියුණු කර ගැනීමට හා ආරම්භ කරන වගාවේ වල් පාලනය සිදුකර ගැනීමේ ක්‍රමවේද භාවිත කරන ලෙසත්

5.6.4 වී වගාව ස්ථාපනය කිරීම සඳහා පැරශුට් වී වගා ක්‍රමය හා පැල සිටුවන යන්ත්‍රය භාවිත කරන ලෙසත් යෝජනා කරන ලදී.

06 කෘෂි රක්ෂණ මණ්ඩලය - ක්ෂේත්‍ර නිලධාරී එස්.පී. සුනිල් මහතා

6.1 දැනට පවතින තත්ත්වයන් අනුව වගාවන් රක්ෂණය කිරීම ඉතාම කාලෝචිත බවත් කෘෂිකර්ම අමාත්‍යංශය යටතේ රාජ්‍ය භාණ්ඩාගාරයෙන් ලබා දෙන මුදල් මත මෙය ක්‍රියාත්මක වන අතර පසුගිය කන්නයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ එක්ලක්ෂ හතලිස් අටදෙනෙකු සඳහා රුපියල් මිලියන 834 වන්දි ලබා දුන් අතර යම් යම් අඩුපාඩු සිදු වී ඇති අතර ඒවාද නිවැරදි කිරීම් කටයුතු සිදු කරන බවත්

6.2 දැනට අපේක්ෂිත පරිදි අක්කරයක් සඳහා රු 645 ක මුදල් සඳහා රු .40000ක රක්ෂණ වන්දියක් ලබා දෙන අතර එම රක්ෂණ මුදල මුලින් ගෙවා තිබීම අවශ්‍ය කරුණක් බවත්

6.3 මෙම වගා රක්ෂණ ක්‍රමයට වගා කාල සටහන බල පැවැත්වෙන බැවින් කන්න රැස්වීම් තීරණ අනුව වගාව සිදු කරන ලෙසත් දැනුම් දෙන ලදී.

07 ගොවි සංවිධාන නිලධාරීන්ගේ අදහස් හා යෝජනා

සහභාගිව සිටි සියළුම ගොවි සංවිධාන නිලධාරීන් ඉදිරි මහ කන්නයේ වගාව පිහිටුවීම සම්බන්ධව දීර්ඝ වශයෙන් අදහස් හා යෝජනා ඉදිරිපත් කළ අතර සියළු දෙනාගේම අදහස වූයේ අහස් වැස්ස උපරිමයෙන් ප්‍රයෝජනයට ගත යුතු බවත් ප්‍රමාණවත් ජල මට්ටමක් ජලාශයට පැමිණි විගස ජලය නිකුත් කිරීම සුදුසු බවත් ඒ අනුව ඉදිරි මහ කන්නය සඳහා පෙර වගා තීරණ ගැනීම සුදුසු බවත්ය.

7.1 පෙර වගා තීරණ ගැනීම.

ඉහත මඟ පෙන්වීම්, අදහස් හා යෝජනා වලින් අනතුරුව 2017/18 මහ කන්නය සඳහා පහත සඳහන් පෙර වගා තීරණ සුදුසු බවට ද.ඉ. පැරකුම් යාය 02 ගොවි සංවිධානයේ ගරු සභාපති ආනන්ද ජගත්වංශ මහතා යෝජනා කළ අතර ව.ඉ. මහසෙන් ගොවි සංවිධානයේ ගරු සභාපති විමල් සමරනායක මහතා විසින් ස්ථිර කරන ලදී.

2017/18 මහ පෙර වගා තීරණ

| | | | |
|---|---|---|---|
| 01. | වගා රැස්වීම සඳහා යෝජිත දිනය | :- | 2017/10/20 |
| 02. | යෝජිත වගා බිම් ප්‍රමාණය | :- | අක්. 6100 |
| 03. | වගා කිරීමට යෝජිත භෝගය | :- | වී - මාස 3, 3 1/2 |
| 04. | වගා කිරීමට යෝජිත ප්‍රදේශය | :- | වම් ඉවුර හා දකුණු ඉවුර ගොවි සංවිධාන බල ප්‍රදේශය තුල |
| 05. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව ගොවි සංවිධාන හා ගොවීන් විසින් ප්‍රධාන ඇළ සහ බෙදුම් ඇලවල් වල නඩත්තු කටයුතු අවසන් කලයුතු දිනය | :- | 2017/10/25 |
| 06. | ගොවීන් විසින් නියමිත දිනට ශුද්ධ නොකරනු ලබන ඇලවල් ගොවි සංවිධාන විසින් ශුද්ධ කලයුතු අවසන් දිනය | :- | 2017/10/30 |
| 07. | මුල් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | :- | 2017/11/01 ( ජලාශයේ ජල මට්ටම අඩි 12 සම්පූර්ණ වූ පසු) |
| 08. | බිම් සැකසීම ආරම්භ කල යුතු දිනය | :- | 2017/11/01 |
| 09. | වපුරා හෝ පැළ සිටුවා අවසන් කල යුතු දිනය | :- | 2017/11/25 |
| 10. | මුර ජල කාලය | :- | දින 95 |
| 11. | මුර ජලය ආරම්භ වන දිනය | :- | 2017/12/01 |
| 12. | අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය | :- | 2018 මාර්තු 01 |
| 13. | වගා රක්ෂණය අවසන් කළ යුතු දිනය | :- | 2017/11/25 |
| 14. | වගා හානි දැනුම් දිය යුතු අවසාන දිනය | :- | 2018 මාර්තු 10 |
| 15. | අස්වනු නෙලා අවසන් කිරීමට යෝජිත දිනය | :- | 2018 මාර්තු 30 |

1994 අංක 13 දරන වාරිමාර්ග (සංශෝධන ආඥා පනතේ 11 වන වගන්තියේ 1 හා 2 අනු වගන්ති යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත නීති රීති

01. ගොවි සංවිධාන නඩත්තු අරමුදල සඳහා වගා කරනු ලබන සෑම අක්කර 01 ක් සඳහාම රු. 300 ක මුදලක් ගොවි සංවිධනයට ගෙවිය යුතුය.

02. නියමිත දිනට ඇලවෙලි ශුද්ධ නොකරන ගොවීන්ගෙන් බඹයකට රු.300 ක මුදලක් ගොවි සංවිධානය විසින් අයකරනු ලැබේ.

03. වාරි නිර්මිත වලට හානි කිරීමේ දඩය - වාරිමාර්ග ආඥා පනත අනුව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.

04. 2017/10//20 සිට 2018/4/15 දක්වා කාලය තුල යායට ගවයන් ඇතුල් කිරීම සම්පූර්ණයෙන්ම තහනම්ය.

08. වී අලෙවි මණ්ඩලය :- සහකාර ප්‍රාදේශීය කළමනාකාර ශ්‍රීමාලි මහත්මිය.
2017/18 කන්නය වෙනුවෙන් සුපුරුදු පරිදි වී මිලදී ගැනීම් කටයුතු සිදු කිරීමට අපේක්ෂිත බව දැනුම් දෙන ලදී.

8.1 ගොවි සංවිධාන මට්ටමින් ඉදිරිපත් වූ ගැටලු
ව.ඉ. මහසෙන් ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික මහතා කතා කරමින් පසුගිය කන්න වල වී මිලදී ගත් අවස්ථාවේදී තම වී මලු මෙතෙක් නොලැබුණු බවත් ඒ සඳහා අළුත් උර හෝ මුදල් ලබා දෙන ලෙසත් ඉල්ලීමක් කරන ලදී. ඊට පිළිතුරු දෙමින් ශ්‍රීමාලි මහත්මිය ඒ පිළිබඳව ප්‍රාදේශීය කළමනාකරු දැනුවත් කර විසඳුමක් ලබා දෙන බව පවසන ලදී.

09. යෙදවුම් හා සේවා සැපයුම් කටයුතු :- කල්ලංචිය ගොවිජන සේවා මධ්‍යස්ථානය නියෝජනය කරමින් කෘ.ප.නි. ස. තිලක් දිසානායක මහතා

9.1 2017/18 මහ කන්නය සඳහා පොහොර සහනාධාර මුදල් ලබා දීමේ කටයුතු සිදුවෙමින් පවතින බවත්

9.2 2017/18 කන්නය සඳහා පසුගිය කන්නයේ වගා හානි වූ සහ වගා නොකළ ගොවීන් සඳහා 50% දායකත්වය යටතේ බිත්තර වී ලබා දෙන බවට එස්.එම්.එස්. පණිවිඩයක් මගින් ප්‍රාදේශීය නිලධාරින් දැනුවත් කර ඇති බවත්

9.3 ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමයට අදාල ජාතික ගොවි සතිය යටතේ පාසල් හා පෙර පාසල් සඳහා පැල ලබා දීමට යෝජනා මත පැල ඉල්ලුම් කර ඇති බවත්

9.4 ගොවි සතියට අදාලව මධ්‍යස්ථාන භූමියේ කාබනික පොහොර ඒකක 05 ක් ගොවි සංවිධාන සහභාගි කරවාගෙන 2017/10/09 දින පුහුණුවක් සමඟ සකස් කළ බවත් දැනුම් දෙන ලදී.

10 - ඉඩම් සංවර්ධන කටයුතු

10.1 රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය නියෝජනය කරමින් ජනපද නිලධාරි ජී.කේ.එම්.යු.එස්.කේ. කවිරාජ් මයා

10.1.1 මේ වන විට කොට්ඨාශ මට්ටමින් බලපත්‍ර 142 ක් සකස් කර අවසන් බවත්

10.1.2 දීමනා පත්‍ර 77 ක් ලැබී ඇති බවත්

10.1.3 රාජ්‍ය බැංකු ලියා පදිංචි කිරීම යටතේ රාජ්‍ය සේවා අන්යෝන්‍ය අර්ථසාධක සංගමය, සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑස් සමාගම, රාජ්‍ය නිලධාරින්ගේ සුභසාධක සංගමය ලියාපදිංචි කර ඇති බවත් දැනුම් දෙන ලදී.

10.2 මිහින්තලය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය නියෝජනය කරමින් ජනපද නිලධාරි සී.එම්. රන්මැණිකේ මහත්මිය.

10.2.1 2017 සැප්තැම්බර් මාසය තුල දීර්ඝකාලින බදු බලපත්‍ර 01 ක් රාජ්‍ය ඉඩම් ආරක්ෂා පනත යටතේ සකස් කර නියෝජ්‍ය ඉඩම් කාර්යාලයට යවා ඇති බවත් රන්බිම දීමනා පත්‍ර සකස්කර කාර්යාලයට ලබා දී ඇති බවත්

10.2.2 2017.10.31 දින 585 තුලාන නවෝදාා සුභසාධක රැස්වීම් ශාලාවේදී ඉඩම් කච්ෂේරියක් පැවැත්වෙන බවත් එදින අනුරාධපුර නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්තුමියගේ ප්‍රධානත්වයෙන් ඉඩම් ගැටළු සඳහා විසඳුම් ලබා දෙන බවත් දැනුම් දෙන ලදී.

11 සත්ත්ව සංවර්ධන කටයුතු

11.1 රඹෑව පශු වෛද්‍ය කාර්යාලය නියෝජනය කරමින් සත්ත්ව සංවර්ධන උපදේශක සුගත් ගමගේ මහතා කතා කරමින්

11.1.1 රඹෑව පශු වෛද්‍ය කාර්යාලය මඟින් සිදු කෙරෙන සාමන්‍ය රාජකාරි කටයුතු සුපුරුදු පරිදි සිදු කරනු ලබන බවත්

11.1.2 2017/18 මහ කන්නය ආරම්භයත් සමඟ ගව පාලන කටයුතු පිළිබඳව ද විශේෂ අවධානයක් යොමු කළ යුතු අතර වී ගොවිතැන හා ගව පාලනය ගැටලු වලින් තොරව පවත්වාගෙන යෑමට කටයුතු කළ යුතු බවත් දැනුම් දෙන ලදී.

11.2 මිහින්තලය පශු වෛද්‍ය කාර්යාලය නියෝජනය කරමින් සත්ත්ව සංවර්ධන උපදේශක නිරන්ජන් සිල්වා මහතා

11.2.1 වාර්ෂික ගව එන්නත් කටයුතු හා පලාත් නිශ්චිත ප්‍රතිපාදන යටතේ ඉදි කල ගව ගාල් පරික්ෂා කිරීමේ කටයුතු මේ දින වල සිදු වන බව දැනුම් දෙන ලදී.

12. වෙනත්

වැඩිදුර අධ්‍යාපනයට අදාලව විදේශ ශිෂ්‍යත්වයක් සඳහා 2017.10.15 දින සිට ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු පී.යු.කේ. තිලකරත්න මහතා විදේශගත වන බැවින් අනුප්‍රප්තික ලෙස මහකනදරාව ව්‍යාපාරයට යොමු කර සිටින වාරිමාර්ග ඉංජිනේරු අමල් බංඩාර මහතා සභාවට හඳුන්වා දීම ඉංජිනේරු තිලකරත්න මහතා සිදු කළ අතර මහකනදරාව ව්‍යාපාරයේ රාජකාරි කටයුතු සිදු කළ සමය තුල අවසන් නොවුනු හා ක්‍රියාත්මක වෙමින් පවතින සහ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් පිළිබඳව සමාලෝචනයක් කළ අතර තමාගේ සේවා කාලය තුල රාජකාරි කටයුතු කිරීමේදී සියළුම රාජ්‍ය ආයතන වල නිලධාරින් හා ගොවි සංවිධාන නිලධාරින් තමාට ලබාදුන් සහයෝගය පිලිබඳව ද ඒ මහතා ස්තුතිය පුද කරන ලදී.

සියළුම ගොවි සංවිධාන වෙනුවෙන් ද.ඉ. පැරකුම් යාය 05 ගොවි සංවිධානයේ ගරු සභාපති ප්‍රේමරත්න මහතා කථා කරමින් වාරිමාර්ග ඉංජිනේරු තිලකරත්න මහතා වාරිමාර්ග ගැටළු වලදී ලබා දුන් සහයෝගය පිළිබඳව විශේෂ ස්තුතිය ඒ මහතාට පුද කළ අතර ව්‍යාපාර කළමනාකරණ කමිටුව වෙනුවෙන් නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමියද රාජකාරි කටයුතු කිරීමේදී තිලකරත්න මහතා ලබා දුන් සහයෝගය පිළිබඳව ස්තුතිය පුද කරන ලදී.

ඉහත කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව ප.ව.1.30 ට පමණ නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමියගේ ස්තුති කථාවෙන් පසු රැස්වීමේ කටයුතු අවසන් කෙරිනි.

මීලඟ ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම 2017 නොවැම්බර් 02 දින පැවැත්වේ.

..............................

I.D.N.I. පතිරණ
නේවාසික ව්‍යාපාර කළමනාකරු
මහකනදරාව ව්‍යාපාරය

<u>පිටපත්</u>

- ❖ ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය,කොළඹ - කා.දැ.ගැ.ස
- ❖ අධ්‍යක්ෂ, වාරිමාර්ග කළමනාකරණ අංශය, කොළඹ - කා.දැ.ගැ.ස
- ❖ දිස්ත්‍රික් ලේකම්, අනුරාධපුර - කා.දැ.ගැ.ස
- ❖ වාරිමාර්ග අධ්‍යක්ෂ, අනුරාධපුර - කා.දැ.ගැ.ස
- ❖ අධ්‍යක්ෂ,ජල කළමනාකරණ අංශය වාරිමාර්ග දෙපාර්තමේන්තුව,කොළඹ - කා.දැ.ගැ.ස
- ❖ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අ/ප), අනුරාධපුර - කා.දැ.ගැ.ස
- ❖ ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්,අනුරාධපුර - කා.දැ.ගැ.ස
- ❖ ප්‍රාදේශීය ලේකම් රඹෑව/මිහින්තලය - කා.දැ.ගැ.ස
- ❖ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු, අනුරාධපුර - කා.දැ.ගැ.ස